මහේස්ත්‍රාත් අධිකරණය
03 OCT 1988
අනුරාධපුරය

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 16 දරන
# ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 මැයි මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 මැයි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල: ශත 90 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි.

# 1988 අංක 16 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 මැයි මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 20/88

**1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 16 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ 2 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1981 අංක 15 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි "දින දහසයකට නොඅඩු හෝ එක් මාසයකට නොවැඩි දිනයක්" යන වචන වෙනුවට "දින දහසයකට නොඅඩු සහ දින විසි එකකට නොවැඩි දිනයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ආ) ඡේදයෙහි "එක් මාසයකට නොඅඩු හෝ මාස දෙකකට නොවැඩි දිනයක්" යන වචන වෙනුවට, "සති හතරකට නොඅඩු සහ සති හයකට නොවැඩි දිනයක්" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) (අ) (1) වන උපවගන්තියෙන් නියම කරන ලද කාලය ඇතුළත තැන්පතුව කරනු ලැබුවේ නම් මිස, අපේක්ෂකයකු විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් හෝ කරන ලද කිසිම තැන්පතුවක් භාරගනු නොලැබිය යුතු ය ; නැතහොත්

(ආ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් අපේක්ෂකයකු විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් හෝ කරන ලද කිසිම තැන්පතුවක් ඒ අපේක්ෂකයා ව්‍යවස්ථාදායකයේ තෝරා පත් කර ගනු ලැබූ මන්ත්‍රීවරයකු වන බවට හෝ ව්‍යවස්ථාදායකයේ තෝරාපත් කර ගනු ලැබූ මන්ත්‍රීවරයකුව සිටි බවට පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ අත්සන යටතේ වූ සහතිකයක් සමග ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස, භාරගනු නොලැබිය යුතු ය.".

2—ඒ 102747—8,060 (88/04)

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "පෙරවරු 8.00 සිට පෙරවරු 11.00 දක්වා වූ කාලසීමාව තුළ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පෙරවරු 9.00 සිට පෙරවරු 11.00 දක්වා වූ කාලසීමාව තුළ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "පෙරවරු 8.00 සහ පෙරවරු 11.30 අතර වූ කාලය තුළ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "පෙරවරු 9.00 සහ පෙරවරු 11.30 අතර වූ කාලය තුළ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ගනු ලැබිය යුතු ඡන්දයක් සඳහා වූ ඡන්ද විමසීමක් අඩාළව කල් තැබීමෙන් පසුව පිළිගත් දේශපාලන පක්ෂය විසින් හෝ වෙනත් යම් දේශපාලන පක්ෂයක් විසින් හෝ ඡන්ද හිමියකු විසින් හෝ නාම යෝජනා කරනු ලැබූ අපේක්ෂකයකු ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර මියගියහොත්, එම මරණය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා සෑහීමට පත් වූ විට, විධානයේ දින සිට දින තුනක් ඇතුළත වෙනත් අපේක්ෂකයකු නාම යෝජනා කරන ලෙස එවැනි යම් පක්ෂයක ලේකම්වරයාට හෝ ඡන්ද හිමියාට හෝ විධාන කළ යුතු ය. ඒ නාම යෝජනාව මේ පනතේ පළමුවන උපලේඛනයේ දක්වා ඇති 'අ' ආකෘතියට සාරානුකූල විය යුතු ය :

එසේ වුව ද, මියගිය අපේක්ෂකයා වෙනුවට අපේක්ෂකයකු නාම යෝජනා කිරීමට ඉඩ දී ඇති කාල සීමාව තුළ දී, එසේ නාම යෝජනා කිරීම, එම පිළිගත් දේශපාලන පක්ෂය, වෙනත් දේශපාලන පක්ෂය හෝ ඡන්ද හිමියා විසින් පැහැර හරිනු ලබයි නම්,—

(අ) එක් අපේක්ෂකයකු පමණක් ඉතිරිව සිටී නම්, ඒ අපේක්ෂකයා ජනාධිපති ධුරයට තේරී පත් වී ඇති ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය ;

(ආ) අපේක්ෂකයන් එක් අයකුට වැඩියෙන් ඉතිරිව සිටී නම්, ඡන්ද පත්‍රිකාවලින් සහ ඡන්ද විමසීමට අදාළ සෙසු සියලු ලේඛනවලින් මියගිය අපේක්ෂකයාගේ නම ඉවත් කරනු ලැබ ඇත්තාක් මෙන් 21 වන වගන්තිය යටතේ වූ ඇන්වීමෙහි නිශ්චිත ආකාරයට ඡන්දය ගැනීම කරනු ලැබිය යුතු ය.". ;

සහ

(2) ඒ වගන්තියේ (ා) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (අ) වන ඡේදයේ "පොලිස් දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ" යන වචන වෙනුවට "පොලිස් දෙපාර්තමේන්තුවේ, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "ඒ නියෝජිතයාගේ නාම සහ ලිපිනය" යන වචන වෙනුවට "ඒ නියෝජිතයාගේ නාම, ජාතික හැඳුනුම් පත් අංකය හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත් අංකය සහ ලිපිනය" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "ඔහුගේ නාම සහ ලිපිනය" යන වචන වෙනුවට "ඔහුගේ නාම, ජාතික හැඳුනුම් පත් අංකය හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත් අංකය සහ ලිපිනය" යන වචන ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ එක් එක් බලයලත් නියෝජිතයාගේ නාම සහ ලිපිනය" යන වචන වෙනුවට "ඒ එක් එක් බලයලත් නියෝජිතයාගේ නාම, ජාතික හැඳුනුම් පත් අංකය හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත් අංකය සහ ලිපිනය" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "ඒ එක් එක් ප්‍රාදේශීය නියෝජිතයාගේ නාම සහ ලිපිනය" යන වචන වෙනුවට "ඒ එක් එක් ප්‍රාදේශීය නියෝජිතයාගේ නාම, ජාතික හැඳුනුම් පත් අංකය හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත් අංකය සහ ලිපිනය" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ "පත් කරන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපිනයන්ද" යන වචන වෙනුවට "පත් කරන ලද තැනැත්තන්ගේ නම්, ජාතික හැඳුනුම්පත් අංකය හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත් අංකය සහ ලිපිනය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද තැනැත්තන්ගේ නම්, ජාතික හැඳුනුම් පත් අංකය හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද හැඳුනුම් පත් අංක සහ ලිපිනයන් ප්‍රකාශ කෙරෙන ඒ පත්වීම් පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීමක් ඒ බලයලත් නියෝජිතයා විසින් ඡන්ද ගණන් කිරීම ආරම්භ වීමට පෙර ගණන් කිරීමේ නිලධරයාට දෙනු ලැබිය යුතු ය. යම් ගණන් කිරීමේ නියෝජිතයකුගේ නාම, ජාතික හැඳුනුම් පත් අංකය හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත් අංකය සහ ලිපිනය එසේ දැනුම් දී නොමැත්තා වූ ද ඒ ගණන් කිරීමේ මධ්‍යස්ථානයට පැමිණ සිටීමට බලය දෙන තේරීම්භාර නිලධරයාගෙන් ලිපියක් ඉදිරිපත් නොකරන්නා වූ ද ගණන් කිරීමේ නියෝජිතයකු ගණන් කිරීමේ මධ්‍යස්ථානයට ඇතුළත් කර ගැනීම, ගණන් කිරීමේ නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (ඇ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇඇ) ලකුණු කරනු ලැබූ ඡන්ද පත්‍රිකාවක් ඡන්ද ස්ථානයක් ඇතුළත දී ඕනෑකමින් ම ප්‍රදර්ශනය කරනු ලබන; හෝ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "වැටුප් අඩු නොවන පරිදි නිවාඩු දෙනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට "වැටුප් අඩු නොවන පරිදි ලියවිල්ලකින් වූ නිවාඩු දෙනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) සෑම සේවායෝජකයකු විසින් ම—

(අ) (1) වන උපවගන්තිය යටතේ නිවාඩු සඳහා ඉල්ලුම් කරන තැනැත්තන්ගේ නම්; සහ

(ආ) ඒ උපවගන්තිය යටතේ නිවාඩු ප්‍රදානය කරනු ලැබූ තැනැත්තන්ගේ නම් සහ ඒ තැනැත්තන්ට ඒ නිවාඩු ප්‍රදානය කරනු ලැබූ කාලසීමාවන්

දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කළ යුතු අතර, ඒ ප්‍රකාශය සේවා නියුක්ති ස්ථානයෙහි ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතුය."; තව ද

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "(1) වන උපවගන්තියේ" යන වචන වෙනුවට "(1) වන උපවගන්තියේ හෝ (1අ) වන උපවගන්තියේ" යන වචන ආදේශ කිරීමෙන්.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඡන්ද විමසීමක් පැවැත්වීමේ දිනයට කලින් වූ හත්වන දිනය අතර යම් අවස්ථාවක" යන වචන වෙනුවට, "ඡන්ද විමසීමක් පැවැත්වීමේ දිනයට කලින් වූ දහවන දිනය අතර යම් අවස්ථාවක" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) ඡන්ද විමසීමේ දිනයට පෙර දහවන දිනයට පසුව (1) වන උපවගන්තියෙහි සඳහන් කිසිම තැපැල් සන්දේශයක් තැපැල්පතිවරයා විසින් හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ භාරදීම සඳහා පිළිගනු නොලැබිය යුතු ය. නැතහොත් ඡන්ද විමසීමේ දිනයට පෙර පස්වන දිනයට පසුව ඡන්ද හිමියකුට භාර දෙනු නොලැබිය යුතු ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා විසින් සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ ඒ උපවගන්තියේ "ගුවන් විදුලි ප්‍රචාරක පහසුකම් පාවිච්චි කිරීමට" යන වචන වෙනුවට "ගුවන් විදුලි ප්‍රචාරක පහසුකම් සහ රූපවාහිනී පහසුකම් පාවිච්චි කිරීමට යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(2) තත් කාර්ය සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරන යම් අපේක්ෂකයකුට (1) වන උපවගන්තියෙහි සඳහන් කාලය තුළ ගුවන් විදුලි සහ රූපවාහිනී ප්‍රචාරක කාලය වෙන් කරදීමේ දී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා විසින් සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා විසින්—

(අ) ගුවන් විදුලි ප්‍රචාරය සම්බන්ධයෙන් වන විට එක් අවස්ථාවක දී හෝ එක් එක් අවස්ථාව මිනිත්තු පහළොවකට නොඅඩු සහ මිනිත්තු තිහකට නොවැඩි අවස්ථා තුනකට නොවැඩිව හෝ පාවිච්චි කරනු ලැබිය හැකි මුළුමනින් මිනිත්තු අනූවකට නොවැඩි කාලයක් ;

(ආ) රූපවාහිනී ප්‍රචාරය සම්බන්ධයෙන් වන විට එක් අවස්ථාවක දී හෝ එක් එක් අවස්ථාව මිනිත්තු පහළොවකට නොවැඩි සහ මිනිත්තු තිහකට නොවැඩි අවස්ථා තුනකට නොවැඩිව හෝ පාවිච්චි කරනු ලැබිය හැකි මුළුමනින් මිනිත්තු අනූවකට නොවැඩි කාලයක්

ගෙවීමක් නොමැතිව පාවිච්චි කිරීමට ඒ එක් එක් අපේක්ෂකයාට අවසර දෙනු ලබන බවට වගබලා ගත යුතු ය.

(3) ජාතික වැදගත්කමක් ඇති යම් කාරණයක් ගුවන් විදුලිය මගින් හෝ රූපවාහිනිය මගින් විවාද කිරීමට අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් එකඟ වන අවස්ථාවක, ඒ වෙනුවෙන් ගෙවීමක් කරනු ලැබූ විට එම කාර්යය සඳහා පහසුකම් සැලසීම ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයාගේ හෝ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයාගේ කාර්යය වන්නේ ය. ගුවන් විදුලිය මගින් හෝ රූපවාහිනිය මගින් ඒ කාර්යය සඳහා යම් අපේක්ෂකයකුට වෙන්කර දෙනු ලබන කාලය මිනිත්තු හතළිස් පහකට නොවැඩි විය යුතු අතර, එය (2) වන උපවගන්තිය යටතේ ඒ අපේක්ෂකයන් විසින් පාවිච්චි කරනු ලැබීමට නියම කරනු ලබන කාලයට අතිරේක විය යුතු ය";

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා විසින් සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ;

" (6) සෑම අපේක්ෂකයකුට ම, ගෙවීමකින් තොරව සහ එම අපේක්ෂකයාට (2) වන සහ (3) වන උපවගන්ති යටතේ වෙන් කර ඇති කාලසීමාවලට අතිරේකව, (2) වන උපවගන්තියෙහි දක්වා ඇති ප්‍රතිපත්ති කෙරෙහි සැලකිල්ල ඇතිව කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන සමාන කාල සීමාවන් සඳහා ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශන පහසුකම් පාවිච්චි කිරීමට, කොමසාරිස්වරයා විසින් අවසර දෙනු ලැබිය හැකි ය.

(7) නාමයෝජනා කිරීමේ දිනයෙන් ආරම්භව ඡන්ද විමසීමේ ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කිරීමේ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ, ඡන්ද විමසීමේ දී යම් අපේක්ෂකයකුගේ අපේක්ෂකත්වය කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ප්‍රවර්ධනය කිරීමේ බලපෑම ඇති වන කිසිම දෙයක්, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ විධාන සලසා ඇති පරිදි හැර, ගුවන් විදුලියෙන් හෝ රූපවාහිනියෙන් ප්‍රචාරය නොකරන බව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා වගබලා ගත යුතු ය. මේ උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා කොමසාරිස්වරයාගෙන් අදහස් විමසා ක්‍රියා කළ යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 119අ වන සහ 119 ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම.*

15. මෙහි පහත දැක්වෙන වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 119 වන වගන්තියට ඉක්බිතිවම ඇතුළත් කරනු ලබන අතර එය එහි 119අ වන සහ 119ආ වන වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :—

*" පොලීසිය කොමසාරිස්වරයාට සහාය විය යුතු බව.*

119අ. මේ පනත යටතේ පැවැත්වෙන ඡන්ද විමසීමක් නිසි ආකාරව පැවැත්වෙන බවට සෑම පොලිස් නිලධරයකු ම වග බලාගත යුතු අතර ඒ සම්බන්ධව කොමසාරිස්වරයා විසින් කරන යම් විධානයක් අනුව කටයුතු කළ යුතු ය.

*නියමිත ඡන්ද පොළක දී ඡන්දය දීමට නොහැකිවීම පිළිබඳ සාධාරණ බියක් ඇති විට ඡන්දය දීමේ කාර්ය පටිපාටිය.*

119ආ. (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් ව ඇතද තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතු කොටගෙන එම ඡන්ද පොළේ දී තමාගේ ඡන්දය දීමට නොහැකි වේතැයි සාධාරණ බියක් ඇති යම් ලියාපදිංචි ඡන්ද හිමියකු විසින්, තමාගේ ඡන්දය, කොමසාරිස් වරයා විසින් ඔහුගේ පරම අභිමතය පරිදි තීරණය කරනු ලබන්නා වූ වෙනත් ඡන්ද පොළක දී දීමට අවසර දෙන ලෙස ඉල්ලමින් ඇතිවරණ කොමසාරිස් වරයා වෙත ඉල්ලුම් පත්‍රයක්, නාම යෝජනා දැන්වීමෙන් එක් සතියක් ඇතුළත දී ඉදිරිපත් කළ හැකි ය.

(2) එවැනි ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් සතියක් ඇතුළත කොමසාරිස්වරයා විසින් එම ඉල්ලුම්පත්‍රය භාර ගන්නා ලද බව නැතහොත් ප්‍රතික්ෂේප කරන ලද බව ඡන්ද හිමියාට දැන්විය යුතු ය. කොමසාරිස්වරයාගේ තීරණය, අවසානාත්මක හා නිරනාත්මක වන අතර එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) එවැනි ඡන්දයක් දී ඇති අවස්ථාවක එම ඡන්දය, එම ඡන්ද හිමියා ලියාපදිංචි වී ඇති මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද සමග ගණන් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන උපලේඛනය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපලේඛනයේ "අ" ආකෘතියේ—

(අ) "අනුක්‍රමික අංකය සඳහන් ප්‍රදේශය සහ ඡන්ද කොට්ඨාසය" යන වචන වෙනුවට "අනුක්‍රමික අංකය, වීදියේ හෝ ගමේ නම, ඡන්ද ප්‍රදේශය සහ ඡන්ද කොට්ඨාසය" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) "පොලිස් දෙපාර්තමේන්තුවේ/ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ /තැපැල් දෙපාර්තමේන්තුවේ සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ/ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ/...ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවක යකු විසින් ;" යන වචන වෙනුවට "පොලිස් දෙපාර්තමේන්තුවේ/බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ/ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ/තැපැල් දෙපාර්තමේන්තුවේ සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ/ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලයේ/......ප්‍රාදේශීය ගමනා ගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනයේ "ආ" ආකෘතියෙහි පිටුපස දැක්වෙන කොටු අත් හැරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන උපලේඛනය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන් වන උපලේඛනයේ (1) වන සහ (2) වන ඡේද සවිතේ දැක්වෙන කොටු අත්හැරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.